# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල


| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1257 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br>Date | 06/10/2023<br>පැය 0700 |

**මාධ්‍ය නිවේදනය**

**බස් රථයක් මතට ගසක් කඩා වැටී සිදුවූ අනතුරක් - කොල්ලුපිටිය පොලිස් වසම.**

2023.10.06 වන අද දින උදෑසන කාලයේ කොල්ලුපිටිය පොලිස් වසමේ ලිබර්ටි වටරවුමේ සිට මීටර් 100 ක් පමණ දුරින් ඩුබ්ලිකේෂන් මාර්ගයේ කොළඹ සිට දෙහිවාය බලා ධාවනය වූ මගී ප්‍රවාහන ලංගම බස් රථයක් මතට මාර්ගය අයිනේ තිබූ විශාල ගසක් කඩා වැටී අනතුරක් සිදුව ඇත.

අනතුරින් බස් රථයේ ගමන් කල පිරිමි පුද්ගලයන් දෙදෙනෙකු හා කාන්තාවක් තුවාල ලබා ප්‍රතිකාර සඳහා කොළඹ ජාතික රෝහලට ඇතුලත් කර ඇත. ගස කඩා වැටීම හේතුවෙන් මාර්ගයේ රථ වාහන ගමනාගමනය අවහිර වී ඇති අතර, මේ වන විට ගස කපා ඉවත් කිරීමේ කටයුතු සිදුකරමින් පවතී. කොල්ලුපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**